Prepared by- දර්ශනී රණතුංග , කෑ/දෙහි/පන්නල මහා විද්‍යාලය



Department of Education,Sabaragamuwa Province/ Weekly School


පාඩම:- සතර අභිනය

අභිනය යනු සංස්කෘත භාෂාවේ එන වචනයකි. සිංහලෙන් එය අදහස් ප්‍රකාශ කිරීම ලෙස අර්ථ දැක්විය හැකිය. භරතමුනිගේ “නාට්‍ය ශාස්ත්‍රයේ”අභිනය යන්න නිර්වචනය වන්නේ 'ඉදිරියට ගෙන ඒම' යන අර්ථයෙනි. නර්තනයේදී හා රංගනයේදී (නාට්‍යවලදී) අභිනය භාවිත කෙරේ. අභිනය සාර්ථකව භාවිත කිරීම මගින් නර්තන හා නාට්‍ය කෙරෙහි ප්‍රේක්ෂකයා ඇඳ බැඳ තබා ගත හැකිය. අභිනය සිව් වැදෑරුම් ය.

1. ආංගික අභිනය

   අංග, ප්‍රත්‍යංග, උපාංග ලෙස සිරුරේ ඇති කොටස් මගින් අදහස් ප්‍රකාශ කිරීම වේ.

2. වාචික අභිනය

   පද්‍ය, ගීත, සංවාද මගින් අදහස් ප්‍රකාශ කිරීමයි.

3. සාත්ත්වික අභිනය

   මුහුණේ ඉරියව් මගින් අදහස් ප්‍රකාශ කිරීම මෙන්ම වෙවුලීම, කඳුළු සැලීම, දහදිය දැමීම ආදිය ද සාත්ත්වික අභිනයට අයත් වේ.

4. ආහාර්ය අභිනය

   රංග වස්ත්‍රාභරණ, වේදිකා සැරසිලි, වේදිකා ආලෝකකරණය ආදී මගින් අදහස් ප්‍රකාශ කිරීම ආහාර්ය අභිනය යි.

1. අභිනය කෙටියෙන් හඳුන්වන්න.
2. අභිනය පිළිබඳ අදහස් දක්වා ඇති භාරතීය රස වාදීන් කවුරුන්ද?
3. අභිනය කොටස් කීයද?
4. ඒ මොනවාද?
5. ඒවා කෙටියෙන් හඳුන්වන්න.
6. එක් එක් අභිනයන් ට උදාහරණයක් බැගින් දක්වන්න.
7. සතර අභිනය භාවිතයෙන් ඇති වාසි මොනවාද?
8. ඔබ නරඹා ඇති රූපවාහිනී නර්තන අංගයකි හෝ වේදිකා නාට්‍යයක සතර අභිනය යොදා ගන්න ඇති අයුරු විමසන්න.
9. පාසල් වේදිකාවට සතර අභිනය යොදා ගනිමින් ඔබ නර්තන අංගයක් ඉදිරිපත් කරන අයුරු පහදන්න.